EDCS

ආරම්භය: 1930 ලි.ප. අංකය: 736
ஆரம்பம்: 1930 பதிவு இல: 736
Inception: 1930 Reg. No: 736

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමූපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමූපකාර සමිතියකි.

සමිතියේ ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා කාර්යාලවල පවතින මතු සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා **සමිතියේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් සහ බාහිර අයදුම්කරුවන්ගෙන්** ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත සඳහන් පොදු කොන්දේසිවලට අදාළව සකසන ලද අයදුම්පත්‍ර 2026-09-19 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් හෝ ගෙනවිත් ප්‍රධාන සභාපති වෙත ලැබෙන සේ භාරදිය යුතුය. තව ද මෙම දැන්වීමේ දැක්වෙන QRකේතය භාවිතා කර මාර්ගගත ක්‍රමයටද අයදුම් කල යුතුය.(QRකේතය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම් කිරීම ප්‍රමාණවත් නොවේ)

(කිළිනොච්චිය, මුලතිව්සහ මන්නාරම දිස්ත්‍රික්කවල හැර දිවයිනේ අනෙකුත් සියළු දිස්ත්‍රික්කවල ප්‍රධාන නගරයන්හි සමිතියේ ශාඛා කාර්යාල පවතී.)

මේ සඳහා කුසලතා පූර්ණ, උද්යෝගිමත් හා කැපවීමෙන් යුතුව වැඩකිරීමේ හැකියාව ඇති සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## <u>ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී (විධායක සේවා අංශයE.2 - III ශ්‍රේණිය)</u>

1. පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

2. පරිගණක විද්‍යාව පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 04 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය** ඃ මාසික 57,400 - 1,200X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

## <u>ප්‍රධාන අභ්‍යන්තර විගණක (විධායක සේවා අංශයE.2 - III ශ්‍රේණිය)</u>

1. පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ පශ්චාත් උපාධියක් සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

2. පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ උපාධියක් සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 04 ක පළපුරුද්ද

**හෝ**

3. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක වසර 04 ක ගණකාධිකරණ/ වාණිජ ඩිප්ලෝමාව සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

4. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසන් අදියර සමත් වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය ඃ මාසික 57,400 - 1,200X 10**

පුරප්පාඩු සංඛ්‍යාව - 01

## කළමණාකරු (විධායක සේවා අංශයE.3.1 - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ ගණකාධිකරණය/ බැංකුකරණය/ වාණිජ්‍යය පිළිබඳ උපාධියක් සමඟ විධායක මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්ද

**හෝ**

2. අ.පො.ස. උසස් පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයක ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ ගණකාධිකරණය/ වාණිජ්‍යය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 05 ක පළපුරුද්ද

**හෝ**

3. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ ගණකාධිකරණය/ වාණිජ්‍යය උපාධියක් සමඟ බඳවා ගැනීම් සිදුකරනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික නිලධාරී තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

4. අ.පො.ස. උසස් පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයක ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ ගණකාධිකරණය/ බැංකුකරණය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ බඳවා ගැනීම සිදුකරනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික නිලධාරී තනතුරක වසර 07 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය** ඃ මාසික 50,600 - 900 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 14

## නීති නිලධාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

1. වසර 03 ක පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතීඥවරයෙකු වීම

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

## පරිපාලන නිලධාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයක මානව සම්පත් කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ උපාධිය සමඟ මානව සම්පත් කළමනාකරණය හෝ ආයතන පරිපාලනය පිළිබඳ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්ද

**හෝ**

2. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ වසරකට නොඅඩු මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ මානව සම්පත් කළමනාකරණය හෝ ආයතන පරිපාලනය පිළිබඳ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

3. ඉහත 1,2 හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර 10 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**හෝ**

4. ඉහත 1,2 හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මෙහෙයුම් සේවා කාණ්ඩයේ කළමනාකරණ සේවා නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී (ගිණුම්)/ විගණන සහකාර තනතුරක වසර 15 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 04

## තොරතුරු තාක්ෂණ නිලධාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය සමඟ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 02ක පළපුරුද්ද

**හෝ**

2. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ රජය පිළිගත් ආයතනයකින් තොරතුරු තාක්ෂණය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 02

## සහකාරකළමණාකරු (විධායක සේවා අංශයE.3.2 - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය/ බැංකුකරණය/ වාණිජ්‍යය උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

2. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයකින් ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය/ බැංකුකරණය/ වාණිජ්‍යය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

3. ඉහත 1,2හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ අදාළ ක්ෂේත්‍රයේ මාණ්ඩලික සේවා කාණ්ඩයේ තනතුරක වසර 10 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**හෝ**

4. ඉහත 1,2හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ අදාළ ක්ෂේත්‍රයේ මෙහෙයුම් සේවා කාණ්ඩයේ තනතුරක වසර 15 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 19

## සහකාර ගණකාධිකාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ/ මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය යන ක්ෂේත්‍රයේ උපාධිය සමඟ ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02ක පළපුරුද්ද

**හෝ**

2. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ වසර 04 ක ඩිප්ලෝමා පාඨමාලාව සමඟ ගිණුම්කරණ / වාණිජ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02 ක පළපුරුද්ද

**හෝ**

3. වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ දෙවන අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

4. ගණකාධිකරණ ශිල්පී ආයතනයේ(AAT)තුන්වන අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**5.** ඉහත 1,2,3හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර 07 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 23

**පොදු කොන්දේසි**

- අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. නමුත් දැනට සමුපකාර සේවයේ යෙදී සිටින අයෙකුට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
- ඉහත සඳහන් තනතුරට අදාළ මාසික වැටුපට අමතරව රු.17,800/-ක ජීවන වියදම් දීමනාවද, අනුමත රු.11,000/-දීමනාවද හිමි වනු ඇත.
- මෙම තනතුර ස්ථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම්ලාභියෙකු සඳහා සේවක අර්ථසාදක අරමුදල වෙනුවෙන් 10%ක් ගෙවිය යුතු අතර, ආයතනයෙන් 15% ක් බැර කෙරෙනු ඇත.
- අයදුම්කරුවන් ජීව දත්ත සහ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇතුළත්ව තමා විසින්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරගත් ජීවදත්ත පත්‍රිකාවක් සමඟ මෙහි සඳහන් අයදුම්පත්‍ර ආකෘතිය අනුව සකස් කර ගත් අයදුම්පත්‍රයක්ද සම්පූර්ණ කර ඉල්ලුම් කළ යුතුය.

**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය**

**.................................................... තනතුරු සඳහා අයදුම්පත්‍රය**

01.අයදුම්කරුගේ සම්පූර්ණ නම :-...............................................................................
...............................................................................

02.මුලකුරු සමඟ නම :-...............................................................................
...............................................................................

03.ස්ථිර ලිපිනය :-...............................................................................
...............................................................................
...............................................................................
...............................................................................

04.ස්ථිර පදිංචිය දරණ දිස්ත්‍රික්කය :-...............................................................................

05.උපන් දිනයː-.........../.........../...........06.වයස :- අවුරුදු ............මාස :-............ දින :-.............

07.ජාතික හැඳුනුම්පත් අංකය :-...............................................................................

08.ස්ත්‍රී/ පුරුෂ භාවයː-................................ 09.විවාහක / අවිවාහක බවː-..................................

10.දුරකථන අංකය :-...................... 11.Whatsapp අංකය :-........................................................

12.E- Mailː-...............................................................................

13.ඉල්ලුම් කරන මූලික සුදුසුකමː-...............................................................................
...............................................................................
...............................................................................
...............................................................................
...............................................................................

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර, මා පහත සඳහන් කරුණු සඳහාද එකඟව මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන බව සහතික කරමි.

- දිවයිනේ ඕනෑම ශාඛා කාර්යාලයක සේවය කිරීමට එකඟ වෙමි.
- තනතුර සඳහා තෝරාගත් පසු, ස්ථානගත කිරීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සිදුකරන බව මා හොඳින් දන්නා බවත්, ඒ මත කරනු ලබන සේවා ස්ථානගත කිරීම් සඳහා මාගේ එකඟතාවය මෙයින් පළකරමි.

....................................... ........................................

දිනය අත්සන

ජා.හැ. අංකය :-.........................................................................

නමː-...............................................................................

- අයදුම්කරුවන් තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතිකවල ඡායා පිටපත් ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද සත්‍ය පිටපතක් බවට තමා විසින්ම සහතික කර2026-09-19දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් ප්‍රධාන සභාපති වෙත ලැබෙන සේ භාර දිය යුතුය. (අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය)
- අයදුම්කරුවන් සමිතියේ ඕනෑම ශාඛා කාර්යාලයක සේවය කිරීමට යෝග්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුතු අයෙකු විය යුතු අතර, සමිතිය සතු දිවයිනේ ඕනෑම ශාඛා කාර්යාලයක සේවය කිරීමට කැමති අයවලුන් විය යුතුය. තෝරා ගැනීමෙන් පසු පුරප්පාඩු පවතින කාර්යාල වෙත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි අනුයුක්ත කිරීම සිදුකරන බැවින් ඒ සඳහා එකඟවිය යුතුය.
- වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු අයෙකු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමන් සේවය කරන සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය. යම් අයෙකු සමුපකාර සමිතියක සේවය කරන අතරතුර ඍජුව අයදුම්පත් එවා ඇති බව ඔහු/ ඇය තෝරාගත් පසුව වුවද අනාවරණය වුවහොත් එය තනතුර අහිමි වීමට හේතුවක් වේ.
- ඉහත සඳහන් පරිදි ලියාපදිංචි තැපැල් මගින් හෝ සමිතියේ ප්‍රධාන සභාපති වෙත ලැබෙන සේ අයදුම් පත් එවීම අනිවාර්ය වන අතර එම සියළුම අයදුම්කරුවන් මෙම දැන්වීමෙහි දක්වෙන QRකේතය භාවිතා කර මාර්ගගත ක්‍රමයටද අයදුම්කර තිබිය යුතුය. (QRකේතය භාවිතා කර මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම් කිරීම ප්‍රමාණවත් නොවේ)

- සමුපකාර සේවක කොමිෂන් සභාවේ සමුපකාර සේවක ආයතන සංග්‍රහය,2025/03හා 2025/04යන චක්‍රලේඛ ප්‍රකාරව මෙම බඳවා ගැනීම් සිදුකරනු ඇත.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ප්‍රධාන සභාපති
සි/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,
අංක294, ගාලු පාර, කොළඹ03.
දුරකථන අංකය:- 011-2266000